ආරම්භය 1945-09-30 ලි.ප. අංකය:39/82

දෙහිවල,සුදර්ශන පාරේ,ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනයේ පිහිටි
දෙහිවල බෞද්ධෝදය සංගමය මගින්, ධර්මදානය පිණිස සෑම පුර පසළොස්වක පොහොය දිනයක් පාසා නිකුත් කරන මාසික දහම් කලාපය.

# බෞද්ධෝදය

79 වර්ෂය - ශ්‍රී බු: ව 2569 | 2026 පෙබරවාරි 01 | නවම් කලාපය

**ඓතිහාසික සිතුල්පව්ව රාජමහා විහාරය,**
**ඓතිහාසික යටගල රාජමහා විහාරය ප්‍රමුඛ අෂ්ඨ මහා විහාරාධිපති,**
**දක්ෂිණ ලංකාවේ සමථ බල සම්පන්න ප්‍රධාන අධිකරණ සංඝනායක**
**සද්ධර්ම කීර්ති ශ්‍රී රතනසාර,**
**කොළඹ නාලන්ද විද්‍යාලයේ හිටපු ධර්මාචාර්ය,**
**ශාස්ත්‍රපති, පූජ්‍ය, ලේල්වල සමිත ස්වාමීන්වහන්සේ**

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

## "මග හොඳට තිබේ නම්"

**"අයෝනි සුද්ධිමන්වේසං - අග්ගිං පරිචරිං වනේ**
**සුද්ධිමග්ගං අජානන්තෝ - අකාසිං අමරං තපං**
**තං සුඛේන සුඛං ලද්ධං - පස්ස ධම්ම සුධම්මතං**
**තිස්සෝ විජ්ජා අනුප්පත්තා - කතං බුද්ධස්ස සාසනං"**

**(ථේරගාථා පාළි, තික නිපාතය අංගණික භාරද්වාජ ථේරගාථා)**

සුපින්වතුනි,

බුදුරජාණන් වහන්සේ මේ බුද්ධ සාසනය මහමුහුදට උපමා කළා. සතර දිගින් විවිධ නම් ඇති ගංගාවලින් ගලා එන ජලය මහමුහුදට වැටුණු විට ලුණු රස ඇති මුහුදු දිය යන නම ලබන්නාසේ විවිධ ජාති, කුල ගෝත්‍රවලින් බුදුසසුනෙහි පැවිදි බව ලබන අය "ශාක්‍ය පුත්‍රයන්ගේ ශ්‍රමණයෝ" යන නම ලබා එකම පිරිසක් බවට පත්වෙනවා. මෙසේ පැවිදි වූ පිරිස අතරින් රහත් බවට පත් වූ භික්ෂූන් හා භික්ෂුණීන් වහන්සේලා බුදුදහම අනුගමනය කිරීමෙන් තමන් ලද සුවය ප්‍රකාශ කරමින් උදාන ගාථා දේශනා කළා.ථේර ථේරී, ගාථාවල ඒවා සඳහන් වෙනවා. අද මා තෝරා ගත්තේ

අංගණික භාරද්වාජ හිමියන් පැවිදි වීමට පෙර නිවන් මග යයි සිතාගෙන නොමග ගිය සැටිත් බුදුහිමියන්ගෙන් බණ අසා පිළිපැද මේ ජීවිතයේදීම නිවන් සැපය ලද හැටිත් කියවෙන උදාන ගාථා දෙකක්.

මෙතුමා පැවිදි වීමට පෙර ගිනිදෙවියා පිදීම නමැති ආගමික විශ්වාසයක එල්ලිලා කටයුතු කළ කෙනෙක්. වනගත වෙලා තමයි ඔහු ඒ ආගමික ව්‍රතය පිරුවේ. මේ ක්‍රමය අද දක්වාම ඉන්දියාවේ පවතිනවා. ගිනිකොණ දිශාවේ ආරක්ෂක දේවතාවා ලෙස සලකා හින්දු ජනතාව ඔවුන්ගේ කෝවිල්වල ගිනිකොණ දිශාවේ විශාල ගිනිමැලයක් දල්වා පුද පූජා පවත්වනවා. "ගින්න" දෙවියන්ගේ මුඛය ලෙස පිළිගන්නා ඔවුන් එම ගින්නට දමන පූජාවන් දෙවියන් විසින් අනුභව කරනවා යැයි විශ්වාස කරනවා. දැන් තියෙන හින්දු ආගම ඇති වුණේ බුද්ධ කාලයේ තිබුණ බ්‍රාහ්මණ ආගමෙන් තමයි. ගිනි මැලයක් දල්වා එයට ගිතෙල්, මීපැණි, ආහාර, මස්, උක්සකුරු, ධාන්‍ය ආදිය දමා පුළුස්සා 'යාගය' නමැති පූජාවක් බුද්ධ කාලයේ විසූ බමුණන් සිදු කළා. යුවලක් විවාහ වූ පසු සැමියාගේ ගෙදරින් යාග ගිනිමැලයේ ගිනි පෙනෙල්ලක් රැගෙන ඇවිත් නව නිවසෙහි ගිනිමැලය දල්වාගෙන එය නිවෙන්නට නොදී දිගටම දල්වා තබා ගන්නවා.

මේ බමුණාගේ පෙර භවයන් ගැන ථේර ගාථා අටුවාවේ සඳහන් වෙනවා. ඒ අනුව මිට කල්ප 91 කට පෙර වැඩ සිටි විපස්සී බුදුහාමුදුරුවන්ගෙන් පසු කල්ප 60 ක් යන තුරු බුදුවරයකු පහළ වුණේ නැහැ. ඒ කල්ප 60 න් පසු සිඛී බුදුරජාණන්වහන්සේ ලොව පහළ වුණා. ඒ කාලෙ මේ බමුණාත් එක්තරා ගමක ඉපදිලා හිටියා. දිනක් පිණ්ඩපාතයේ පිණිස වඩින සිඛී බුදුහාමුදුරුවන්ගේ සාන්ත ගමන, සන්සුන් ඉරියව් දැක පැහැදුණු මොහු ඉක්මනින් පාරට පැමිණ පසඟ පිහිටුවා වැඳ ඇදිලි බැඳගෙන බොහෝ සතුටින් බුද්ධශ්‍රීය දිහා බලාගෙන ඉඳලා සිත පහදවා ගත්තා. බුදුහාමුදුරුවො වැඩියාට පස්සේ නිතර ඒ ගැන සිහි කරමින් සද්ධාව ඇතිකර ගත්තා. මිය යන වෙලාවෙත් ඔහුගේ සිතට නැගුනේ ඒ බුද්ධශ්‍රීය.

ඒ කුසලයේ බලයෙන් දෙව් මිනිස් දෙගතියෙහි කල්ප තිහක් ගතකොට අපේ ගෞතම බුදුහාමුදුරුවන්ගේ කාලෙ හිමාලය පර්වතය අසල උක්කට්ඨා නුවර ධනවත් බමුණු කුල ගෙයක ඉපදී අංගණික භාරද්වාජ නම ලැබුවා. බමුණකු වශයෙන් උගත යුතු වේද වේදාංග හොඳින් උගත් මොහුට කල් යාමේදී ගිහි ජීවිතය ගැන කලකිරීමක් ඇති වී පරිබ්‍රාජකයකු ලෙස පැවිදි වී ගිනි දෙවියා පුදමින් දිගු කලක් වන ගත වී තපස්කම් කළා.

අපේ ගෞතම බුදුහාමුදුරුවන් ජනපද චාරිකාවේ වඩින විට එදා සිඛී බුදුහාමුදුරුවන් දැක ඇති වූ පැහැදීම වැනි බලවත් පැහැදීමක් ඇතිවී ළඟට ගිහින් වැන්දා. මොහුට ධර්මය අවබෝධ කර ගැනීමට හේතු වාසනා සම්පත් ඇති බව දුටු බුදුරජාණන්වහන්සේ දාන කථා, සීල කථා ආදී අනුපිළිවෙල කථාව දේශනා කළා. රිදී සීනු සෙලවෙන්නාක් වැනි බුදුරදුන්ගේ දේශනාව අසාගෙන සිටි බමුණාගේ සිත ධර්මයට එකඟ වුණා.

ඉන් පරිබාහිරව අදහස් ඒම නැවතුනා. පිරිසිදු විලක පැහැදිලි දිය වගේ සිත ඉතා ප්‍රසන්න භාවයට පත් වුණා. කාමච්ඡන්ද ආදී පංච නීවරණ ධර්ම යටපත් වුණා. අන්න ඒ අවස්ථාවේදී බුදුන් වහන්සේ චතුරාර්ය සත්‍යය ඇතුළත් සාමොක්කංසික දේශනාව සිදු කළා. ඒ අසා පැහැදුණු බමුණා පැවිදි වෙලා නොබෝ කලකින් විදර්ශනා වඩා රහත් වුණා.

ටික දිනක් විමුක්ති සුඛයෙන් ගත කළ අංගණික භාරද්වාජ හාමුදුරුවෝ තවමත් ගිනි දෙවියා පුදමින්, මිත්‍යා සීල හා ව්‍රත අනුගමනය කරමින් සිටින තමන්ගේ ඥාතීන්ටත් මේ උතුම් ධර්මය පහදා දීම සඳහා උක්කට්ඨා නුවරට වැඩියා. තම ඥාති පිරිසත් තෙරුවන් සරණයෙහි පිහිටුවා පන්සිල් සමාදන් කරවා ඔවුන් බෞද්ධ ප්‍රතිපදාවට හුරුවන තුරු ටික කලක් එහි වාසය කොට එතැනින් නික්මී කුරු ජනපදයේ 'කුණ්ඩිය නමැති ගමට වැඩියා.

එක දවසක් මේ රහතන් වහන්සේ උග්ගාරාමයට වැඩම කළ වෙලාවේ උත්තරාපථයෙන් පැමිණි තමාගේ හිත මිතුරන්ව සිටි බමුණු පිරිසක් හමු වුණා. ඔවුන් තෙරුන්ගෙන් මෙසේ ඇසුවා. ඔබ බමුණු දහම අත්හැර බුදුදහම වැළඳ ගත්තේ කිනම් ආශ්චර්යයක් දැකලද? එවිට බුදුදහමෙන් පිට වෙනත් කිසිම දහමක නිවනට මග නැති බව පෙන්වා දෙමින් අංගණික භාරද්වාජ හාමුදුරුවො මා මාතෘකා කර ගත් ගාථා ප්‍රකාශ කළා.

අයෝනි = අනුවණ කම නිසා වැරදි පිළිවෙතකින්, සුද්ධිං අන්වේසං = සංසාර ශුද්ධිය හෙවත් නිවන සොයමින්, වනේ = වනයෙහි, අග්ගිං පරිචරිං = ගිනි පිදූවෙමි, සුද්ධිමග්ගං =නිවනට මග, අජානන්තෝ = නොදැන, අමරං තපං = බමුණන් පවසන පරිදි නොමැරෙන බවට යන තපස, අකාසිං = කළෙමි.

බුදුහාමුදුරුවන් වදාළ මාර්ගයේ ගොස් නිවන සැපය ලද බව කීමට දෙවන ගාථාව ප්‍රකාශ කළා. සුඛෙන = අත්තකිලමථානුයෝගයේ මෙන් සිරුරට දුක් නොදී සමථ හා විදර්ශනා යන සුඛ ප්‍රතිපදාවෙන්, තං සුඛං ලද්ධං = ඒ නිවන් සුවය ලැබුවෙමි. ධම්ම සුධම්මතං = තථාගත ධර්මය යහපත් ධර්මයක් බව, පස්ස = බලන්න, තිස්සෝ විජ්ජා = බමුණන් කියන පරිදි ඍග්, යජුර්, සාමන්, යන ත්‍රිවේදය ගැන දැනුම ඇතිකර ගැනීම නොව පුබ්බේනිවාසානුස්සති, දිබ්බචක්ඛු, ආසවක්ඛය යන ශ්‍රේෂ්ඨ විද්‍යා තුන අනුප්පත්තා = ලැබුවෙමි, බුද්ධස්ස සාසනං = බුදුහාමුදුරුවන් ලෝක සත්වයා ට දුන් දහම් පණිවිඩය, කතං = මා විසින් කරන ලදී.

ත්‍රිවිද්‍යා උපදවා ගැනීමෙන් තමයි රහත් භාවයට පත් වන්නේ. පුබ්බේනිවාසානුස්සති ඥාණය :- මේ නුවණ උපදවා ගත් විට පෙර භවයන් ගැන සිහි කරන්න පුළුවන්. රූපාවචර චතුර්ථ ධ්‍යානය හෙවත් උපේක්ඛා ඒකග්ගතා සහිත ධ්‍යාන සිත උපදවා ගත් කෙනෙකුට පෙර භවයන් සිහිකිරීම පිණිස සිත යොමු කළ හැකියි. එසේ උත්සාහ දරන විට ඔහුට එකින් එක ආපස්සට තමන් පෙර භවයේ විසූ තැන්, ලැබූ නම් ගම් සිහිපත් වෙනවා. රහතන් වහන්සේලාට ආපස්සට බැලිය හැකි ආත්මභාව ගණනෙහි සීමාවක් ඇතත් බුදුවරුන්ට එවැනි බාධාවක් නැහැ. අපි ගමනක් ගිහින් නැවත ගෙදර ආපසු එම ගමන පටන් ගත් තැන සිට සියලු තොරතුරු සිහිපත් කරන්න පුළුවන් වගෙයි.

දිබ්බචක්ඛු ඤාණය :- මෙයට චුතූපපාත ඤාණය කියලත් කියනවා. මෙමගින් සත්ත්වයන් චුත වන හැටි නැවත උපදින හැටි තමන්ගේ අත්දැකීමක් විදියට දකින්න පුළුවන්. දෙවියන්ට තියෙන දිබ්බචක්ඛු ඤාණය නොවෙයි. ඔවුන්ගේ ඇසේ සියුම් බව නිසා ඈත ඇති දේත් ඔවුන්ට පෙනෙනවා. දෙවියන්ට තියෙන ඇස් නිසයි දිවැස් කියන්නේ. දිබ්බචක්ඛු ඤාණය ඇති අයට දුර දකින්නත් පුළුවන්. හතරමං හන්දියක් අසළ ඉදිකර ඇති මහල් ගෙයක උඩුමහලේ සිටින කෙනෙකුට සිව් දෙසින්ම යන එන මිනිසුන් දකින්න ලැබෙනවා "වගේ මැරෙන උපදින සත්ත්වයන් දකින්නත් පුළුවන්".

ආසවක්ඛය ඤාණය :- සියලු ආශ්‍රවයන් ක්ෂය කළ බවට, ගෙවා දැමූ බවට ඇති වන නුවණයි. රහතන් වහන්සේ 'ඛීණාසව' නම් වන්නේ ඒ නිසාය. කාමාසව, භවාසව, දිට්ඨාසව, අවිජ්ජාසව යනුවෙන් ආසව ධර්ම හතරක් ඇත. සසරෙහි බොහෝ කාලයක සිට අපේ සිතේ පල්වෙමින් මේවා පවතිනවා.

කාමාසව කියන්නේ රූප, ශබ්ද,ගන්ධ,රස,ස්පර්ශ යන පංචකාමයට හුරුවෙච්ච ගතියයි. බාහිරව පවතින එවැනි දේ වස්තුකාමයි. ඒවා ගැන සිතේ ඇතිවන ඇලීම, බැඳීම, ක්ලේශ කාමයයි. කාමාසව කියන්නේ මේ ක්ලේශ කාමයටයි.

අපේ මේ ශරීරයට බාහිරව ලෝකයක් කියා එකක් ඇත කියා අපේ හිතේ හැඟීමක් තියෙනවා. අම්මා, තාත්තා, පොල් ගස ආදී නම් සිහිපත් කරන විට ඒ රූප අපේ සිතේ මැවෙනවා. මේ 'ඇති බව' ට භවාසව කියා කියනවා.

බාහිරව සිටින අය, තියෙන දේවල් අසන දකින රස විඳින මම කියා කෙනෙක් ඉන්නවා යන වැරදි අදහස දිට්ඨාසවයයි. සක්කාය දිට්ඨිය සෝවාන් මාර්ගඥානයෙනුත්, අස්මිමානය අරහත් මාර්ගඥානයෙනුත් නැතිවෙනවා.

අපේ ඇස කන ආදියට ගෝචර වන රූප ශබ්ද ආදිය හේතු ප්‍රත්‍ය බලපෑම මත ඇතිවන, පවතින, නැතිවන ඒවා යැයි නොදන්නාකම අවිජ්ජාසවයයි.
ආශ්‍රවක්ෂය ඥානය ලැබූ විට මේ ආශ්‍රව හතරම නැති වෙනවා. මේ ඤාණ තුන බුදුදහමේ "ත්‍රිවිද්‍යා" තිස්සෝ විජ්ජා යන නම් වලින් හැඳින්වෙනවා.

ඒ නිසා පින්වත් ඔබත් නිවන් දැකීමට හැකි ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කිරීමට යොමුවන්න .

ඔබ සැමට තෙරුවන් සරණයි!